සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

# ව්‍යවසායකත්ව අධ්‍යයනය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. සහජයෙන් උරුම විය හැකි මෙන්ම අධ්‍යාපනය හා පළපුරුද්ද තුළින් සකස් කරගත හැකි හා වර්ධනය කරගත හැකි දෙයකි.
(i) නවෝත්පාදනය (ii) ව්‍යවසායකත්වය (iii) නිර්මාණශීලීත්වය (iv) මනෝවිහීතිය

02. ධනය, වෛද්‍ය වරයාගේ ශ්‍රමය, ගොඩනැගිලි, තීරණ ගැනීම යනාදිය තුළින් හඳුනාගත හැකි නිෂ්පාදන සාධක පිළිවෙලින් දක්වෙන්නේ,
(i) භූමිය, ශ්‍රමය, ව්‍යවසායකත්වය, ප්‍රාග්ධනය
(ii) ප්‍රාග්ධනය, ශ්‍රමය, භූමිය, ව්‍යවසායකත්වය
(iii) ප්‍රාග්ධනය, භූමිය, ව්‍යවසායකත්වය, ශ්‍රමය
(iv) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

03. මේද රහිත කිරි නිෂ්පාදනය අයත් වන නවෝත්පාදන සිදුවන ආකාරය වන්නේ,
(i) දිගුවකි.
(ii) අනුකරණයකි.
(iii) සංකලනයකි.
(iv) නව සොයා ගැනීමකි.

04. භාණ්ඩවල ඇති සුවිශේෂී ලක්ෂණයකි.
(i) නිෂ්පාදනයත් සමග පරිභෝජනය සිදු වීම.
(ii) සමජාතීය බව ආරක්ෂා වීම.
(iii) ගබඩා කළ නොහැකි වීම.
(iv) සපයන්නාගෙන් වෙන්කළ නොහැකි වීම

05. අවදානමට ප්‍රධානතම හේතුව,
(i) අවිනිශ්චිතභාවයයි.
(ii) නම්‍යශීලීත්වයයි.
(iii) ගතික ස්වභාවයයි.
(iv) නිර්මාණශීලීත්වයයි.

06. අසීරු අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි නැඹුරු වූ චරිතයකි,
(i) ජෙසිකා කොක්
(ii) රිචඩ් නැන්ටිනම්
(iii) තෝමස් අල්වා එඩිසන්
(iv) ජෝෂප් ෂුම්පුටර්

07. චිත්‍රපට, දුරකථනය, සපත්තු මගින් ඉටුවන අවශ්‍යතා පිළිවෙලින් දක්වා ඇත්තේ,
(i) ඇඳුම්, සන්නිවේදනය, විනෝදාංශ
(ii) සන්නිවේදනය, ඇඳුම්, විනෝදාංශ
(iii) විනෝදාංශ, ඇඳුම්, සන්නිවේදනය
(iv) විනෝදාංශ, සන්නිවේදනය, ඇඳුම්

08. භාණ්ඩ හා සේවා යන දෙවර්ගයටම පොදු ලක්ෂණය වන්නේ,
(i) භෞතික පැවැත්මක් පැවතීමයි.
(ii) මිනිස් අවශ්‍යතා වුවමනා තෘප්තිමත් කිරීමයි.
(iii) සපයන්නාගෙන් වෙන් කළ නොහැකි වීමයි.
(iv) ගබඩා කළ නොහැකි වීමයි.

09. ''ලාභ ලබමින් සිටි සමන්ගේ ඉන්ධන පිරවුම්හල මේ වන විට අලාභ ලබන තත්ත්වයට පත්ව ඇත.'' මෙමගින් පිළිබිඹු වන ව්‍යාපාර ගති ලක්ෂණය වන්නේ,

(i) අරමුණක් පැවතීමයි. (ii) ආර්ථික කටයුත්තක් වීමයි.
(iii) අවදානමක් පැවතීමයි. (iv) ගනුදෙනු අඛණ්ඩව සිදුවීමයි.

10. ප්‍රධාන වශයෙන් ව්‍යවසායක වර්ග කීයද?

(i) 2 කි. (ii) 3 කි. (iii) 4 කි. (iv) 5 කි.

11. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා යන දෙදෙනාම,

(i) ආර්ථික කටයුත්තක යෙදෙයි. (ii) ගැටළු නිර්මාණශීලීව විසඳයි.
(iii) තරඟය කැමැත්තෙන් සොයායයි. (iv) නිර්මාණශීලීව නිෂ්පාදන ඉදිරිපත් කරයි.

12. ව්‍යවසායකත්ව ප්‍රතිලාභ ලැබෙන ආකාර,

(i) 2 කි. (ii) 3 කි. (iii) 4 කි. (iv) 5 කි.

13. ව්‍යවසායකත්වයෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභයකි.

(i) ස්වයංපෝෂිත බව (ii) ආකර්ෂනීය ලාභ ඉපයීම
(iii) ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම (iv) කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම.

14. නවෝත්පාදන සඳහා පදනම් වන මූලාශ්‍රයක් වන්නේ,

(i) නව සොයා ගැනීමක් (ii) අනුකරණයක්
(iii) සංකලනයක් (iv) වෙළඳපොලේ වෙනස්වීමක්

15. ව්‍යවසායකයකු මුහුණදෙන අවදානම හා ප්‍රතිලාභය අතර ඇති සම්බන්ධය වන්නේ,

(i) අවදානම අඩු නම් ප්‍රතිලාභය වැඩි වේ.
(ii) අවදානම වැඩි නම් ප්‍රතිලාභය වැඩි වේ.
(iii) අවදානම වැඩි නම් ප්‍රතිලාභය අඩු වේ.
(iv) අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධයක් නැත.

16. මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ හඳුන්වන්නේ,

(i) වුවමනා නමිනි. (ii) භාණ්ඩ නමිනි. (iii) නිෂ්පාදිත නමිනි. (iv) අවශ්‍යතා නමිනි.

17. ආයතනික ව්‍යවසායකයින් සඳහා උදාහරණයක් වන්නේ,

(i) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා
(ii) මහත්මා ගාන්ධි මැතිතුමා
(iii) ඵලදායිතා සම්මාන හිමිකරගත් විදුහල් ප්‍රධානීන්
(iv) මාරි කියුරි මැතිණිය.

18. සිල්ලර වෙළෙන්දා,

(i) සමාජයීය ව්‍යවසායකයෙකි. (ii) ව්‍යාපාර ව්‍යවසායකයෙකි.
(iii) හරිත ව්‍යවසායකයෙකි. (iv) ආයතන ව්‍යවසායකයෙකි.

19. තමන්ගේ ගමන් මග මෙන්ම ගමනාන්තය තමා විසින්ම තීරණය කිරීම හා පාලනය කිරීමේ හැකියාව,

(i) ස්වාධීනත්වයයි. (ii) අනාගත දැක්මයි. (iii) ආත්ම විශ්වාසයයි. (iv) ස්වයං පෙළඹවීමයි.

20. ව්‍යාපාර පරිමාණය අනුව වර්ග කිරීමේදී බෙදා දක්වන ව්‍යාපාර වර්ග සංඛ්‍යාව වන්නේ,

(i) 2 කි. (ii) 3 කි. (iii) 4 කි. (iv) 5 කි.

21. පෞද්ගලික හිමිකාරීත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන සාපේක්ෂව කුඩා සේවක සංඛ්‍යාවක් හා අඩු ආයෝජනයක් සහිත ව්‍යාපාර හඳුන්වන්නේ,

(i) ක්ෂුද්‍ර ව්‍යාපාර නමිනි. (ii) කුඩා ව්‍යාපාර නමිනි.
(iii) මධ්‍ය පරිමාණ ව්‍යාපාර නමිනි. (iv) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නමිනි.

22. කුඩා පරිමාණ ව්‍යාපාර වල සීමාවක් නොවන්නේ,

(i) වෙළඳපොළ සීමා වීම. (ii) නවීන තාක්ෂණය භාවිතා වීම.
(iii) ප්‍රාග්ධනය රැස් කර ගන්නා මාර්ග සීමා වීම. (iv) හිමිකරුවන්ගේ ව්‍යාපාරික පලපුරුද්ද අඩු වීම.

23. ව්‍යාපාර හිමිකරුවන් ලෙස සපයා ගත් සම්පත් ව්‍යාපාරයේ අරමුණු ලඟාකර ගැනීම සඳහා නිසි ලෙස භාවිතා කිරීම හඳුන්වන්නේ,

(i) අයිතිකරුගේ භූමිකාව නමිනි. (ii) නායකත්ව භූමිකාව නමිනි.
(iii) කළමනාකරුගේ භූමිකාව නමිනි. (iv) ව්‍යවසායකත්ව භූමිකාව නමිනි.

24. යම් කටයුත්තක් කිරීමේදී එයට අදාළ එක් එක් පාර්ශව විසින් ඉටු කළ යුතු කාර්යභාරය හඳුන්වන්නේ,

(i) කුසලතා නමිනි. (ii) නිපුණතා නමිනි.
(iii) කළමනාකරණය නමිනි. (iv) භූමිකා නමිනි.

25. සේවකයන් පෙළඹවීම හා අවශ්‍ය මඟ පෙන්වීම සිදුකිරීම අයත් වන්නේ,

(i) අයිතිකරු භූමිකාවටය. (ii) නායකත්ව භූමිකාවටය.
(iii) කළමනාකරු භූමිකාවටය. (iv) සංවිධායක භූමිකාවටය.

26. ව්‍යාපාරයක් සාර්ථක කරගැනීමට හා වැඩි දියුණු කිරීමට අවශ්‍ය උපායමාර්ග තීරණය කිරීමට ව්‍යවසායකයෙකුට ඇති හැකියාව,

(i) සන්නිවේදන කුසලතාවයි. (ii) උපදේශන කුසලතාවයි.
(iii) සංකල්පනාත්මක කුසලතාවයි. (iv) මානව කුසලතාවයි.

27. ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම පිණිස යොදා ගන්නා සියලු අවාසිදායක සාධක හඳුන්වන්නේ,

(i) අවස්ථා ලෙසය. (ii) ශක්තීන් ලෙසය. (iii) සීමා ලෙසය. (iv) ප්‍රතිඵල ලෙසය.

28. ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) අයිතිකරු, සේවකයෝ, සම්පත්
(ii) අයිතිකරු, ගනුදෙනුකරුවෝ, සම්පත්
(iii) සේවකයෝ, අයිතිකරුවෝ, තරගකරුවෝ
(iv) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, ගනුදෙනුකරුවෝ

29. ව්‍යාපාර බාහිර පරිසරය තුළ ඇති පරිසර සාධක වලින් ව්‍යාපාරයට ඉතා සමීපව ක්‍රියාත්මක වන බලවේග ඇතුළත් පරිසරය හඳුන්වන්නේ,

(i) බාහිර පරිසරය ලෙසය. (ii) අභ්‍යන්තර පරිසරය ලෙසය.
(iii) සාර්ව පරිසරය ලෙසය. (iv) ආසන්න පරිසරය ලෙසය.

30. ව්‍යාපාරයක කාර්යයන්හි නිරතවන පුද්ගයෝ,

(i) සේවකයෝ ය. (ii) කළමනාකරුවෝ ය.
(iii) අයිතිකරුවෝ ය. (iv) ආයෝජකයෝ ය.

31. අනාගතයේ ව්‍යාපාර ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන්නන් අයත් වන්නේ කුමන පරිසරයටද?
(i) ආර්ථික පරිසරයට ය. (ii) ආසන්න පරිසරයට ය.
(iii) බාහිර පරිසරයට ය. (iv) සාර්ව පරිසරයට ය.

32. ව්‍යාපාර පරිසරය වර්ග කළ හැකි ආකාර දෙක වන්නේ,
(i) අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය. (ii) ආසන්න පරිසරය හා සාර්ව පරිසරය.
(iii) බාහිර පරිසරය හා සාර්ව පරිසරය (iv) අභ්‍යන්තර පරිසරය හා ආසන්න පරිසරය

33. බැංකු ණය පොලී අනුපාතය වැඩිවීම ව්‍යාපාරවලට,
(i) දුර්වලතාවයකි. (ii) ශක්තියකි. (iii) තර්ජනයකි. (iv) අවස්ථාවකි.

34. රජය ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නීතිරීති පැනවීම අයත් වන්නේ,
(i) ආර්ථික පරිසරයටය. (ii) තාක්ෂණික පරිසරයටය.
(iii) දේශපාලන හා නෛතික පරිසරයටය. (iv) ගෝලීය පරිසරයටය.

35. ව්‍යාපාරයට ප්‍රාග්ධනය සපයන පුද්ගලයෝ හඳුන්වන්නේ,
(i) අයිතිකරුවන් ලෙසය. (ii) සැපයුම්කරුවන් ලෙසය.
(iii) සේවකයන් ලෙසය. (iv) කළමනාකරුවන් ලෙසය.

36. ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයේ පවතින වාසිදායක හා අවාසිදායක සාධක පිළිවෙලින් දක්වා ඇති පිළිතුර කුමක්ද?
(i) දුර්වලතා හා ශක්තීන් (ii) ශක්තීන් හා තර්ජන
(iii) ශක්තීන් හා දුර්වලතා (iv) අවස්ථා හා තර්ජන

37. ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේදී එහි ක්‍රියාකාරීත්වයට බාහිරින් බාධා පමුණුවන සාධක හඳුන්වන්නේ,
(i) ශක්තීන් ලෙසය. (ii) සීමා ලෙසය. (iii) දුර්වලතා ලෙසය. (iv) තර්ජන ලෙසය.

38. පොලී අනුපාත, මිල මට්ටම් හා සේවා නියුක්තිය අයත් වන්නේ,
(i) දේශපාලන පරිසරයටය. (ii) නෛතික පරිසරයටය.
(iii) ප්‍රජා පරිසරයටය. (iv) ආර්ථික පරිසරයටය.

39. සැලසුමට අනුව කටයුතු සිදුවනවාදැයි සොයා බැලීම අයත් වන්නේ,
(i) කළමනාකරු භූමිකාවට ය. (ii) අයිතිකරු භූමිකාවට ය.
(iii) නායකත්ව භූමිකාවට ය. (iv) ගනුදෙනුකරු භූමිකාවට ය.

40. ව්‍යවසායකත්ව කුසලතා පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(i) මානව කුසලතා, තාක්ෂණික කුසලතා, උපදේශන කුසලතා
(ii) තාක්ෂණික කුසලතා, කළමනාකරණ කුසලතා, උපදේශන කුසලතා
(iii) මානව කුසලතා, නායකත්ව කුසලතා, කළමනාකරණ කුසලතා
(iv) තාක්ෂණික කුසලතා, නායකත්ව කුසලතා, උපදේශණ කුසලතා

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

# ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) පහත දැක්වෙන සිද්ධිය කියවා (i) සිට (x) දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුඩා අවධියේ සිට විවිධ පාවහන් විලාසිතා පිළිබඳව කැමැත්තක් දැක්වූ සංජය පාසල් අධ්‍යාපනයෙන් පසු පාවහන් නිපදවීමේ ව්‍යාපාරයක් පිළිබඳව සිහින දැක්කේ ය. තම පියාගෙන් ලද මුදලක් හා සහෝදරයාගෙන් ලද ගොඩනැගිල්ල සහිත ඉඩම ව්‍යාපරය ඇරඹීමට සංජයට විශාල උදව්වක් විය. මව විසින් සංජයට රැකියාවක් සොයගන්නා ලෙස බලකල ද එය අභියෝගයක් කොටගත් ඔහු විලාසිතාකරණය පිළිබඳව පාඨමාලාවක් ද හැදෑරීය. මුලදී අසීරුවෙන් ආරම්භ කර පවත්වාගෙන ගියද එයින් පසුබෑමකට පත් නොවූ සංජය වසර කිහිපයකින් ප්‍රධාන පෙළේ පාවහන් නිපදවීමේ ව්‍යාපාරයක් බවට තම ව්‍යාපාරය පත් කළේය. ප්‍රදේශයේ ජනතාවට තම නිවෙස්වල සිටම පාවහන් සඳහා අවශ්‍ය සමහර කොටස් නිපදවීමට අවස්ථාව ලබා දී ඇති අතර ඔහුගේ නිෂ්පාදන රටවල් කිහිපයකට ද අපනයනය කරයි. සාර්ථක ව්‍යාපාරිකයින්ගෙන් ලබාගත් උපදෙස් ද තම ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතු වූ බව සංජය පිළිගනී. සැලසුමට අනුව කටයුතු සිදුවනවා ද යන්න පිළිබඳව නිරන්තරයෙන් සැලකිලිමත් වන සංජය තම සේවකයින්ගේ සේවය අගය කරමින්, ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කර තම ව්‍යාපාරය සාර්ථකත්වය කරා මෙහෙයවයි.

(i) සංජය සතු ව්‍යවසායකත්ව ගුණාංග 04 ක් සඳහන් කරන්න.

(ii) ඔහුගේ ව්‍යාපාරයෙන් සපුරාලන අවශ්‍යතාවය කුමක්ද?

(iii) සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක 02 ක් සඳහන් කරන්න.

(iv) සංජයගේ ව්‍යාපරය සඳහා සුදුසු දැක්මක් ලියන්න.

(v) සංජයගේ ව්‍යාපාරයෙන් ඔහුට ලැබෙන ප්‍රතිලාභයක් හා ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභයක් ලියන්න.

(vi) මෙම ව්‍යාපාරය තුළ දැකිය හැකි ශක්තියක් ලියන්න.

(vii) මෙම ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට සංජය අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග 02 ක් ලියන්න.

(viii) අයිතිකරුගේ භූමිකාව හා නායකයාගේ භූමිකාව නිරූපණය වන කාර්යයන් 02 ක් සිද්ධියෙන් සොයා ලියන්න.

(ix) මෙම ව්‍යාපාරයේ පවතින අභ්‍යන්තර පරිසර සාධක 02 ක් දක්වන්න.

(x) සංජය විසින් ප්‍රධාන වශයෙන්ම සලකා බැලිය යුතු සාර්ව පරිසරය හා ඔහුගේ ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර අංශය සඳහන් කරන්න.

(02) (i) ව්‍යවසායකත්වය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

(ii) පහත සඳහන් නිදසුන් අයත්වන නිෂ්පාදන සාධක සඳහන් කරන්න.

- වෛද්‍යවරයෙකුගේ ශ්‍රමය
- උපකරණ
- පස
- නිෂ්පාදන සාධක සංකලනය කිරීම.

(iii) නිර්මාණශීලීත්වයට බාධාකාරීවන සාධක 04 ක් දක්වන්න.

(iv) ඔබ පාසලේ දීර්ඝ කාලයක සිට පවතින තවමත් නොවිසඳී ඇති ගැටළු 02 ක් ලියා ඒවාට නිර්මාණශිලී විසඳුම් 02 ක් දක්වන්න.

(v) නිර්මාණශීලීත්වය අගය කළ හැකි ආකාර 02 ක් ලියන්න.

(03) (i) ව්‍යාපාරයක ප්‍රධාන කාර්යයන් 02 ක් සඳහන් කරන්න.

(ii) භාණ්ඩ හා සේවා යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ආරක්ෂාව, විනෝදාංශ, සන්නිවේදනය හා අධ්‍යාපනය යන අවශ්‍යතා සපුරාලන වුවමනා 01 බැගින් දක්වන්න.

(iv) ව්‍යාපරවල ''අවදානම'' ලෙස හඳුන්වන්නේ කුමක්ද?

(v) ව්‍යාපාරවල පැවතිය හැකි අරමුණු 02 ක් සඳහන් කරන්න.

(04) (i) ''ව්‍යවසායකයා ඕනෑම අවදානමක් බාරගනී.'' ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද? හේතුව දක්වන්න.

(ii) සමාජයීය ව්‍යවසායකයින්ට විසඳුම් ලබාදීමට සිදු වී තිබෙන සමාජ ප්‍රශ්න 02 ක් සඳහන් කරන්න.

(iii) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට ලැබෙන මූල්‍යමය ප්‍රතිලාභයක් හා මූල්‍යමය නොවන ප්‍රතිලාභයක් සඳහන් කරන්න.

(iv) ව්‍යවසායකයෙකුට සමාජ සුභසාධනය වෙනුවෙන් දායක විය හැකි ආකාර 04 ක් දක්වන්න.

(v) ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට සිදුවන ප්‍රතිලාභ 02 ක් ලියන්න.

(05) (i) කුඩා පරිමාණ ව්‍යාපාරයක දැකිය හැකි ගති ලක්ෂණ 04 ක් දක්වන්න.

(ii) නවෝත්පාදන වැඩිපුරම කුඩා පරිමාණ ව්‍යාපරය තුළින් බිහිවීමට හේතුවන කරුණු 02 ක් සඳහන් කරන්න.

(iii) කුඩා පරිමාණ ව්‍යාපාරවල ශක්තීන් ලෙස හඳුන්වන්නේ මොනවාද?

(iv) කුඩා පරිමාණ ව්‍යාපාර ආශ්‍රිත සීමා 02 ක් සඳහන් කරන්න.

(v) දැනට අසාර්ථකත්වයට පත් වී ඇති ව්‍යාපාරයක් නැවත සාර්ථකත්වය කරා ගෙනයාම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 02 ක් යොජනා කරන්න.

(06) (i) පහත කාර්යයන් තුළින් නිරූපණය වන ව්‍යවසායකත්ව භූමිකා ලියා දක්වන්න.

- ව්‍යාපාර සැලසුම් සැකසීම.
- සේවකයින් පෙළඹවීම.
- ව්‍යාපාරයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම.
- වැදගත් තීරණ ගැනීම.

(ii) සන්නිවේදන කුසලතා හා උපදේශන කුසලතා සඳහා උදාහරණ 01 බැගින් ලියන්න.

(iii) ව්‍යාපාර පරිසරය ලෙස හඳුන්වන්නේ කුමක්ද?

(iv) අභ්‍යන්තර පරිසරයට අයත්වන සාධක 04 ක් සඳහන් කරන්න.

(v) ව්‍යාපර කටයුතු සඳහා අවශ්‍යවන භෞතික සම්පත් 04 ක් ලියන්න.

(07) (i) ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ලබාගත හැකි ප්‍රයෝජන 02 ක් ලියා දක්වන්න.

(ii) ප්‍රජා පරිසරයට හා ආර්ථික පරිසරයට අයත් සාධක 02 බැගින් සඳහන් කරන්න.

(iii) ස්වභාවික පරිසරයෙන් උදාවිය හැකි අවස්ථාවක් හා තර්ජනයක් සඳහන් කරන්න.

(iv) පහත සඳහන් දෑ අයත්වන ව්‍යාපාර අංශ නම් කරන්න.

- ධීවර කර්මාන්තය
- ගොඩනැගිලි ඉදිකිරීම්
- බැංකු කටයුතු
- රක්ෂණ කර්මාන්තය

(v) මානව සම්පත් හා මානව නොවන සම්පත් අතර වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2023**

**10 ශ්‍රේණිය** **ව්‍යවසායකත්ව අධ්‍යයනය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (ii) | 11 - (i) | 21 - (ii) | 31 - (ii) |
| 2 - (iv) | 12 - (i) | 22 - (ii) | 32 - (i) |
| 3 - (i) | 13 - (iii) | 23 - (iii) | 33 - (iii) |
| 4 - (ii) | 14 - (iv) | 24 - (iv) | 34 - (iii) |
| 5 - (i) | 15 - (ii) | 25 - (ii) | 35 - (i) |
| 6 - (iii) | 16 - (iv) | 26 - (iii) | 36 - (iii) |
| 7 - (iv) | 17 - (iii) | 27 - (iii) | 37 - (iv) |
| 8 - (ii) | 18 - (ii) | 28 - (i) | 38 - (iv) |
| 9 - (iii) | 19 - (i) | 29 - (iv) | 39 - (i) |
| 10 - (iii) | 20 - (ii) | 30 - (i) | 40 - (i) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) නිර්මාණශීලී බව, නම්‍යශීලී බව, අවදානම් බාර ගැනීම, සුභවාදී බව, ආත්ම විශ්වාසය, අධිෂ්ඨානශීලී බව.

(ii) ඇඳුම් පැළඳුම්

(iii) ගොඩනැගිල්ල, ඉඩම, සේවක ශ්‍රමය, ව්‍යවසායකත්වය

(iv) සුදුසු පිළිතුරකට ල. 02 යි.

(v) සංජයට

- ආකර්ශනීය ලාභයක් ලැබීම.
- සමාජ සුභසාධනය සඳහා දායකවිය හැකිවීම.
- නිදහස හා ඉහළ තෘප්තිය.

ආර්ථිකයට

- රැකියා අවස්ථා ජනනය
- රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යාම.
- විදේශ විනිමය ඉපයීම.
- ප්‍රාදේශීය සංවර්ධනය
- ආර්ථික සංවර්ධනයට දායක වීම.

(vi) පාවහන් සඳහා අවශ්‍ය සමහර කොටස් ප්‍රදේශයේ ජනතාව මගින් නිවදවා ගතහැකිවීම (පහසුවෙන් සම්පත් සපයාගත හැකිවීම.)

(vii)
- සාර්ථක වූ ව්‍යාපාරිකයින්ගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම.
- ව්‍යාපාර සැලසුමට අනුව කටයුතු කිරීම.
- මෝස්තරකරණය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම.

(viii) අයිතිකරුගේ භූමිකාව - සැලසුමට අනුව කටයුතු සිදුවනවාදැයි බැලීම.
නායකයාගේ භූමිකාව - සේවකයින් අගය කිරීම.

(ix) අයිතිකරුවන්, සේවකයින්

(x) ප්‍රජා පරිසරය, ද්විතීයික අංශයට

(02) (i) ව්‍යවසායකත්වය යනු පරිසරයේ ඇත ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින් නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදන බිහි කිරීමෙහි යෙදෙන මිනිස් චින්තනය හා සම්බන්ධ වූ ක්‍රියාවලයකි.

(ii)
- වෛද්‍යවරයෙකුගේ ශ්‍රමය - ශ්‍රමය
- උපකරණ - ප්‍රාග්ධනය
- පස - භූමිය
- නිෂ්පාදන සාධක සංකලනය කිරීම. - ව්‍යවසායකත්වය

(iii)
- විශ්වාසය හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම.
- ගැටළුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම.
- ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම.
- තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම.
- ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම.
- රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීම.
- වැරදීම් හා වවේචන සඳහා ඇති බිය.

(iv) නිර්මාණශීලී විසඳුම් 02 කට ල. 02 යි.

(v)
- මූල්‍යමය ත්‍යාග ලබාදීම.
- උපහාර ලබාදීම.
- සම්මාන, සහතික ලබාදීම.
- වාචිකව අගය කිරීම.

(03) (i) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට භාණ්ඩ හා සේවා නිපදවීම.
භාණ්ඩ බෙදාහැරීම හා සම්බන්ධ කටයුතු

(ii) මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලන ඕනෑම දෙයක්.

(iii) සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

(iv) ව්‍යාපාරවලින් ලාභ හෝ පාඩු සිදුවීමට ඇති ඉඩකඩ.

(v) ලාභ අරමුණ, ලාභ නොලැබීමේ අරමුණ (සුභ සාධන අරමුණ)

(04) (i) එකඟ නොවේ.
ව්‍යවසායකයා අවදානම තක්සේරු කර දැරිය හැකි අවදානම් පමණක් බාරගනී.

(ii) ජල හිඟය, පෝෂණ ගැටළු, නූගත්කම, දුගී බව, මත්ද්‍රව්‍ය උවදුර, වසංගත රෝග, දරුවන් - දෙමාපියන් දුරස්වීම, දුරකථනයට ඇබ්බැහි වීම, අන්තර්ජාලයට ඇබ්බැහි වීම.... ආදී ගැලපෙන පිළිතුරු 02 ක්.

(iii) මූල්‍යමය ප්‍රතිලාභ - ආකර්ශනීය ලාභයක් ලැබීම.
වෙනත් ප්‍රතිලාභ
- ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම.
- කාර්යයන්හි විවිධත්වයක් පැවතීම.
- සමාජයීය සුභ සාධනය සඳහා දායකවිය හැකිවීම.
- ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකිවීම.
- ස්වයංපෝෂිත බව
- වර්ධනය සඳහා පුද්ගලයන්ට ලැබෙන්නා වූ උපරිම අවකාශය.
- නිදහස හා ඉහළ තෘප්තියකට පත්වීම.

(iv) පිළිගත හැකි පිළිතුරු 04 ට ල. 02 යි.

(v)
- දේශිය සම්පත් උපයෝජනය කිරීම.
- ප්‍රාදේශීය සංවර්ධනයක් සිදුවීම.
- නව භාණ්ඩ හා සේවා වෙළඳපොලට ඉදිරිපත් කිරීම.
- රැකියා අවස්ථා ජනනය කිරීම.
- විදේශ විනිමය ඉපයීම.
- රටේ සමස්ත නිෂ්පාදනය ඉහළ යාම.
- ආදායම් බෙදියාමේ විෂමතාව අඩුවීම.

(05) (i)
- කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම.
- සේවක සංඛ්‍යාව අඩුවීම.
- ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතුවීම.
- ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී තීරණ ගැනීමට ඇති පහසුව
- ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට පමණක් සීමා වීම.

(ii)
- ව්‍යවසායකත්ව කුසලතා ප්‍රායෝගිකව භාවිත කිරීමට අවස්ථාව තිබීම.
- අත්හදා බැලීම් සඳහා පහසුවක් තිබීම.
- වෙළඳපොළ හිඳුස් අධ්‍යයනයට අවස්ථාවක් පැවතීම.
- මහා පරිමාණ ව්‍යාපාර, කුඩා පරිමාණ ව්‍යාපාර අවස්ථා කෙරෙහි උනන්දු නොවීම.

(iii) ව්‍යාපාරයක් අරඹා පවත්වාගෙන යාම පිණිස යොදාගන්නා සහ යොදාගත හැකි සියලුම වාසිදායක සාධක ශක්තීන් ලෙස හඳුන්වයි.

(iv)
- ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධන රැස්කර ගන්නා මාර්ග සීමාවීම.
- නවීන තාක්ෂණය භාවිත නොවීම.
- වෙළඳපොල සීමාවීම.
- ව්‍යාපාරික කටයුතුවලට පවුලේ සාමාජිකයින්ගේ මැදිහත්වීම වැඩිවීම.
- ව්‍යාපාර හිමිකරුගේ ව්‍යාපාරික දැනුම හා පලපුරුද්ද සීමාකාරී වීම.

(v) ♦ නිවැරදි සැලසුම් සැකසීම හා ඒ අනුව ක්‍රියාත්මක වීම.
♦ ප්‍රවීනයින්ගේ උපදෙස් හා මඟපෙන්වීම් ලබාගැනීම.
♦ ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම.
♦ පරිසරයේ වෙනස්කම් හඳුනාගෙන ඒවාට අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම.
♦ පෞද්ගලික ජීවිතය ව්‍යාපාර කටයුතුවලින් වෙන් කිරීම.
♦ රාජ්‍ය ආයතනවල සහාය ලබාගැනීම.
♦ යහපත් මානව සබඳතා පවත්වා ගැනීම.

(06) (i) ♦ කළමනාකරුගේ භූමිකාව ♦ නායකයාගේ භූමිකාව
♦ අයිතිකරුගේ භූමිකාව
(ii) සුදුසු උදාහරණ 02 කට ල. 02 යි.
(iii) ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට ව්‍යාපාර අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර ව ධනාත්මකව හා ඍණාත්මකව බලපෑම් ඇතිකරන සාධක හා බලවේග සියල්ලයි.
(iv) අයිතිකරුවන්, සේවකයින්, සම්පත්, කළමනාකරුවන්
(v) යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, වාහන, මුදල්

(07) (i) ♦ ව්‍යාපාරය සතු ශක්ති සහ දුර්වලතා හඳුනා ගැනීම.
♦ පරිසරයේ පවතින විවිධ ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම.
♦ ව්‍යාපරය මුහුණ දෙන තර්ජන හඳුනා ගැනීම.
♦ පරිසර වෙනස්වීම්වලට ගැලපෙන පරිදි නිෂ්පාදන හා අලෙවි කටයුතු පවත්වාගෙන යාම.
♦ පරිසර වෙනස්වීම්වලට ගැලපෙන පරිදි සැලසුම් සකස් කිරීම හා උපාය මාර්ග තීරණය කිරීම.
(ii) ප්‍රජා පරිසරයට - ජනගහන වර්ධන වේගය, ජන සංයුතිය, වයස් ව්‍යුහය.
ආර්ථික පරිසරයට - පොලී අනුපාතිකය, මිල මට්ටම, සේවා නියුක්තිය, වැටුප් මට්ටම, දේශීය විනිමය අනුපාතය
(iii) ගැලපෙන පිළිතුරු 02 කට ල. 02 යි.
(iv) ♦ ප්‍රාථමික අංශය ♦ ද්විතියික අංශය ♦ තෘතියික අංශය
(v) පිළිගත හැකි පිළිතුරු 02 කට ල. 02 යි.